ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
කළමනාකරණ අධ්‍යයන උපාධි පාඨමාලාව – පස්වන මට්ටම
අවසාන පරීක්ෂණය – 2009
ව්‍යාපෘති ඇගයීම – MCU 3204

කාලය : පැය තුනයි

දිනය: 2009.02.21 වේලාව : ප ව 1.30 – ප ව 4.30

උපදෙස්: (අ) **ප්‍රශ්න අංක1 (අනිවාර්ය) සහ තවත් ප්‍රශ්න තුනකට (03)** පිළිතුරු සපයන්න.
(ආ) වැඩ සටහන් සම්පාදනය කළ නොහැකි ගණක යන්ත්‍ර භාවිතා කළ හැක.
(ඇ) වර්තමාන අගයන් වගු මේ සමග අමුණා ඇත.

01. ශ්‍රී ලංකාවේ දකුණු පළාතේ සංවර්ධන ව්‍යාපෘතියක් අනුපුරනය කිරීම සඳහා නව ප්‍රවාහන ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට "සිල්වර් ට්‍රාන්ස්පෝට්" සමාගම සැලසුම් කරයි. මූලික ආයෝජනය ලෙස රුපියල් මිලියන 5 ක වියදමක් දැරීමට සමාගමට සිදු වේ මෙම ව්‍යාපෘතියේදී සමාගමට ගෙවීම් කරනු ලබනුයේ වාර්ෂිකව ධාවනය කරන කිලෝ මීටර ගණන පදනම් කර ගෙනය සෑම වසරකම ආරම්භයේදී රුපියල් මිලියන 2.5ක ස්ථාවර මුදලක් සමාගමට ලැබෙන අතර ඉතිරිය ධාවනය කළ කිලෝ මීටර ගණන සැලකිල්ලට ගෙන වර්ෂය අවසානයේදී ගෙවනු ලබයි. පහත දැක්වෙනුයේ "සිල්වර් ට්‍රාන්ස්පෝට්" විසින් සපයන ලද ඇස්තමේන්තු දත්තයන්ය.

| | 2010 | 2011 | 2012 | 2013 | 2014 |
|---|---|---|---|---|---|
| දුර ප්‍රමාණය (කි.මී.) | 37000 | 39000 | 37000 | 40000 | 45000 |
| කි.මී. කට ගාස්තුව (රු) | 70/- | 75/- | 80/- | 90/- | 100/- |
| කි.මී. කට පිරිවැය | 20/- | 23/- | 28/- | 32/- | 35/- |

නඩත්තු කිරීමේ වියදම් පළමු වර්ෂය සඳහා රුපියල් 200,000 ලෙසද ඉන් පසු සෑම වර්ෂයකදීම පෙර වසරට වඩා රු 100,000 ක් වැඩි වනු ඇතැයි ගණන් බලා ඇත. වර්ෂිකව රුපියල් 200,000 ක් පරිපාලන වියදම් ලෙස වැය කිරීමටද සමාගමට සිදු වනු ඇත. රුපියල් මිලියන 3 බැගින් වූ වාර්ෂික ලීසිං වාරිකයක් පළමු වර්ෂ තුන සඳහා ගෙවීමට සිදු වේ. කාරක ප්‍රාග්ධනය ලෙස රුපියල් 500,000 ක් ආයෝජනය කිරීමට ද නියමිතය.

(i) වර්ෂ 2012 දී වෙනත් සමාගමක් දකුණු පළාත් සංවර්ධන ව්‍යාපෘතියට සේවය කිරීමට ඉහත ව්‍යාපෘතියම ආරම්භ කරයි නම් ඉහත ව්‍යාපෘතිය ඵලදායී ව්‍යාපෘතියක් වේද? ඔබේ පිළිතුර පැහැදිලි කරන්න. (ලකුණු 06)

(ii) ඉහත ව්‍යාපෘතියෙහි මූල ආයෝජනයෙන් 80% ක් 24% ක පොලී අනුපාතිකයක ණයකින් ලබා ගන්නා අතර ඉතිරිය 20% ක ආයෝජන ප්‍රතිලාභ ලබන හිමිකරු ප්‍රාග්ධනය යොදාගෙන මූල්‍යනය කරන්නේ නම් ව්‍යාපෘතියෙහි ශුද්ධ වර්ථමාන අගය ගණනය කරන්න. (ලකුණු 12)

(iii) "සිල්වර් ට්‍රාන්ස්පෝට්" සමාගම 140% ක ශුද්ධ ආයෝජන ප්‍රතිලාභයක් ලබා දෙන වෙනත් ව්‍යාපෘතියක් ද සැලසුම් කරයි. ශුද්ධ ආයෝජන ප්‍රතිලාභ අනුපාතය සලකා බලන කල මෙම ව්‍යාපෘතිය ශක්‍ය ව්‍යාපෘතියක්ද? (ලකුණු 06)

(iv) ව්‍යාපෘතියෙහි ගිණුම්කරණ ඵලදා අනුපාතය ගණනය කරන්න. (ලකුණු 05)

(v) මුළු ව්‍යාපෘතියෙන්ම 25%ක ප්‍රතිලාභයක් අපේක්ෂා කරන 'හිමිකරු ප්‍රාග්ධනයෙන් ' මූල්‍යයතය කරන්නේ නම්, අභ්‍යන්තර ප්‍රතිලාභ අනුපාතයට අනුව මෙම ව්‍යාපෘතියෙහි ශක්‍යතාවය විභාග කරන්න. (ලකුණු 06)

(vi) ශ්‍රී ලංකාවේ ආර්ථික සහ දේශපාලන පරිසරය සැලකිල්ලට ගනිමින් ව්‍යාපෘතියෙහි ශක්‍යතාවය විමසන්න. (ලකුණු 05)

( මුළු ලකුණු 40)

02. (i) "ව්‍යාපෘති ජීව කාලය රේඛීය හැඩයක් වන අතර වක්‍රීය හැඩයක් නැත." ඔබ මෙම ප්‍රකාශය සමග එකඟ වන්නේද? ඔබේ පිළිතුර පැහැදිලි කරන්න. (ලකුණු 10)

(ii) "පරමාර්ථ නිර්ණය කිරීමෙන් අනතුරුව ව්‍යාපෘතිය පිළිගනු ලැබේ, නැතහොත් ප්‍රතික්ෂේප කෙරේ." උදාහරණ දක්වමින් මෙම ප්‍රකාශය පැහැදිලි කරන්න. (ලකුණු 10)

03 (i) ශක්‍යතා අධ්‍යයනයකට පෙර වෙළඳපොල පිළිබඳව නිශ්චිතවම දැන ගැනීම ව්‍යාපෘති සැලසුම් කරුවන්ට වැදගත් වන්නේ මන්ද? පැහැදිලි කරන්න. (ලකුණු 10)

(ii) ශ්‍රී ලංකාවේ දේශපාලන පරිසරය ව්‍යාපෘති සැලසුම්කරණයේ දී කෙසේ බලපා ඇත්දැයි පැහැදිලි කරන්න. (ලකුණු 10)

04 (i) ව්‍යාපෘති සැකසුම් කිරීමේ අධියරේදී ආයතනික විශ්ලේපණයන් ඇතුලත් කිරීම වැදගත් වන්නේ මන්දැයි පහදන්න. (ලකුණු 10)

(ii) "ගනික කළමනාකරුවකු ව්‍යාපෘතියක සාර්ථකත්වය සඳහා ඉතා ප්‍රධාන සාධකයකි." එවැනි කළමනාකරුවකුගේ ප්‍රධාන ලක්ෂණ මොනවාදැයි පැහැදිලි කරන්න. (ලකුණු 10)

05 (i) ඒක කාලවිඡේද අයවැයන් පවතින විටදී ඔබ ව්‍යාපෘති තෝරා ගන්නේ කෙසේද? (ලකුණු 10)

(ii) ව්‍යාපෘතීන් ස්වායත්ත වන විටදී ඔබ ඒවා ඇගයීම් කරන්නේ කෙසේද? ව්‍යාපෘතීන් එකිනෙකට සම්බන්ධ ඒවා වන විටදී, මෙම ඇගයීම් වෙනස් වන්නේ කෙසේද? (ලකුණු 10)

-හිමිකම් ඇවිරිනි-

Table of Present Values

## *Table of Present Values*

$PVIF = 1/(1+i)^n$

| Period (n) | Discount rates | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 8% | 9% | 10% | 11% | 12% | 13% | 14% | 15% | 16% | 17% | 18% | 19% | 20% | 22% | 24% |
| 1 | 0.9259 | 0.9174 | 0.9091 | 0.9009 | 0.8929 | 0.8850 | 0.8772 | 0.8696 | 0.8621 | 0.8547 | 0.8475 | 0.8403 | 0.8333 | 0.8197 | 0.8065 |
| 2 | 0.8573 | 0.8417 | 0.8264 | 0.8116 | 0.7972 | 0.7831 | 0.7695 | 0.7561 | 0.7432 | 0.7305 | 0.7182 | 0.7062 | 0.6944 | 0.6719 | 0.6504 |
| 3 | 0.7938 | 0.7722 | 0.7513 | 0.7312 | 0.7118 | 0.6931 | 0.6750 | 0.6575 | 0.6407 | 0.6244 | 0.6086 | 0.5934 | 0.5787 | 0.5507 | 0.5245 |
| 4 | 0.7350 | 0.7084 | 0.6830 | 0.6587 | 0.6355 | 0.6133 | 0.5921 | 0.5718 | 0.5523 | 0.5337 | 0.5158 | 0.4987 | 0.4823 | 0.4514 | 0.4230 |
| 5 | 0.6806 | 0.6499 | 0.6209 | 0.5935 | 0.5674 | 0.5428 | 0.5194 | 0.4972 | 0.4761 | 0.4561 | 0.4371 | 0.4190 | 0.4019 | 0.3700 | 0.3411 |
| 6 | 0.6302 | 0.5963 | 0.5645 | 0.5346 | 0.5066 | 0.4803 | 0.4556 | 0.4323 | 0.4104 | 0.3898 | 0.3704 | 0.3521 | 0.3349 | 0.3033 | 0.2751 |
| 7 | 0.5835 | 0.5470 | 0.5132 | 0.4817 | 0.4523 | 0.4251 | 0.3996 | 0.3759 | 0.3538 | 0.3332 | 0.3139 | 0.2959 | 0.2791 | 0.2486 | 0.2218 |
| 8 | 0.5403 | 0.5019 | 0.4665 | 0.4339 | 0.4039 | 0.3762 | 0.3506 | 0.3269 | 0.3050 | 0.2848 | 0.2660 | 0.2487 | 0.2326 | 0.2038 | 0.1789 |
| 9 | 0.5002 | 0.4604 | 0.4241 | 0.3909 | 0.3606 | 0.3329 | 0.3075 | 0.2843 | 0.2630 | 0.2434 | 0.2255 | 0.2090 | 0.1938 | 0.1670 | 0.1443 |
| 10 | 0.4632 | 0.4224 | 0.3855 | 0.3522 | 0.3220 | 0.2946 | 0.2697 | 0.2472 | 0.2267 | 0.2080 | 0.1911 | 0.1756 | 0.1615 | 0.1369 | 0.1164 |

| Period (n) | Discount rates | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 25% | 26% | 27% | 28% | 30% | 32% | 34% | 36% | 38% | 40% | 42% | 44% | 46% | 48% | 50% |
| 1 | 0.8000 | 0.7937 | 0.7874 | 0.7813 | 0.7692 | 0.7576 | 0.7463 | 0.7353 | 0.7246 | 0.7143 | 0.7042 | 0.6944 | 0.6849 | 0.6757 | 0.6667 |
| 2 | 0.6400 | 0.6299 | 0.6200 | 0.6104 | 0.5917 | 0.5739 | 0.5569 | 0.5407 | 0.5251 | 0.5102 | 0.4959 | 0.4823 | 0.4691 | 0.4565 | 0.4444 |
| 3 | 0.5120 | 0.4999 | 0.4882 | 0.4768 | 0.4552 | 0.4348 | 0.4156 | 0.3975 | 0.3805 | 0.3644 | 0.3492 | 0.3349 | 0.3213 | 0.3085 | 0.2963 |
| 4 | 0.4096 | 0.3968 | 0.3844 | 0.3725 | 0.3501 | 0.3294 | 0.3102 | 0.2923 | 0.2757 | 0.2603 | 0.2459 | 0.2326 | 0.2201 | 0.2084 | 0.1975 |
| 5 | 0.3277 | 0.3149 | 0.3027 | 0.2910 | 0.2693 | 0.2495 | 0.2315 | 0.2149 | 0.1998 | 0.1859 | 0.1732 | 0.1615 | 0.1507 | 0.1408 | 0.1317 |
| 6 | 0.2621 | 0.2499 | 0.2383 | 0.2274 | 0.2072 | 0.1890 | 0.1727 | 0.1580 | 0.1448 | 0.1328 | 0.1220 | 0.1122 | 0.1032 | 0.0952 | 0.0878 |
| 7 | 0.2097 | 0.1983 | 0.1877 | 0.1776 | 0.1594 | 0.1432 | 0.1289 | 0.1162 | 0.1049 | 0.0949 | 0.0859 | 0.0779 | 0.0707 | 0.0643 | 0.0585 |
| 8 | 0.1678 | 0.1574 | 0.1478 | 0.1388 | 0.1226 | 0.1085 | 0.0962 | 0.0854 | 0.0760 | 0.0678 | 0.0605 | 0.0541 | 0.0484 | 0.0434 | 0.0390 |
| 9 | 0.1342 | 0.1249 | 0.1164 | 0.1084 | 0.0943 | 0.0822 | 0.0718 | 0.0628 | 0.0551 | 0.0484 | 0.0426 | 0.0376 | 0.0332 | 0.0294 | 0.0260 |
| 10 | 0.1074 | 0.0992 | 0.0916 | 0.0847 | 0.0725 | 0.0623 | 0.0536 | 0.0462 | 0.0399 | 0.0346 | 0.0300 | 0.0261 | 0.0227 | 0.0198 | 0.0173 |